
යාළු
ගෙම්බා
තමිලා කරුණාරත්න

කෘතියේ නම - යාළු ගෙම්බා

ප්‍රථම මුද්‍රණය - 2025.02.08

කතෘගේ නම - තමිලා කරුණාරත්න

සේවය කරන පාසල - මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

චිත්‍ර - නෙතිනි කල්පගේ දියණිය
බිනුවරී සේසාක්‍යා දියණිය
සතිනි වීරසිංහ දියණිය
උමේධා මුදලිගේ දියණිය

ISBN - 978-624-208-581-4

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : **PRADEEP DVD HOUSE,**
**Nattarampotha,**
**Tel:- 0718 805 914**

# පිදුම

මෙලොව වෙසෙන

සුවහසක් දරුවන්ට

පුදමි.

# පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්නශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානික වු ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වු භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ ඒ සඳහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරාහා සිදුකිරීම වඩාත් ඵලදායි වෙයි

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි

මෙවර අප පාසලේ ආදි කත්‍ෘ කරදන අත්ථදස්සී මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණ ගත්කරණී "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් වීම ප්‍රශංශනීය කරුණකි ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගේ හැඟීමයි

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර


මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

ඒදා සකිඳු පාසල් යන්න උදේම නැගිට්ටා.



ඉක්මනින් මුහුණ සෝදා ගත්ත සකිඳු
ඇඳුම් ඇඳගෙන උදේ කෑම ගන්න
කෑම මේසයට ගියා.





කෑම කළා අවසන් වූ
සකිඳු බුදුන් වැන්දා.



සපත්තු දෙක අතට ගත්ත සකිඳු සපත්තු දෙක දාගෙන පාසලට පයින් ම ගමන් කළා.



ටික දුරක් යන විට සකිළූට
ඒයාගේ සපත්තුව ඇතුළේ ඇති
යම් දෙයක් පිම්බෙන බව
දැනුණා නැවත ඒය
හැකිලෙන බව දැනුණා.



සකිඳු එය එතරම් නොසිතා පාසලට ගියා. පාසල ආරම්භ වූ පසු නැවත සකිඳුට සපත්තුව ඇතුළේ ඇති දෙයක් පිම්බෙන හැකිලෙන බව දැනුණා.



සකිඳු ඒ වේලාවේ තම සපත්තුව ගලවා ඇතුළ බැලුවා.



"සපත්තුව ඇතුළේ ලොකු ගෙම්බෙක්" යාළුවෝ හැමෝම කෑගහලා කිව්වා. සපත්තුවෙන් එළියට පැන්න ගෙම්බා පන්තිය වටේම ගියා.



සකිඳු පන්තියට ගෙනාපු ගෙම්බා දිගටම සකිඳුත් යාළුවොත් සමඟ පන්තියේම සිටියා.



එයත් පන්තියේ ම ඉන්න
සකිඳූගේ යාළුවෙක් වුණා.



# පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සුදානම් කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය  ඔවුන් සමාජයේ පෙරගමන් කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ  පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ  සමාජ වගකීමයි

මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ  හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සමග පොත් ලියන "හෙරණගත්කරණී "ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුනට ද  ආදර්ශයකි ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්

හෙරණගත්කරණී නිර්මාතෘ

සෙනෙවිරත්න මහලේකම්

2025 02 08